**විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහායක ව්‍යාපෘතිය (ගිවිසුම් අංක - 3409 එස්ආර්අයි) - 2023**

---

විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහායක ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලිබලය සැපයීමේ සහ බෙදාහැරීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 24,228.15 කට සමාන වූ එජඩො මිලියන 160.20 වන අතර ඉන් රු. මිලියන 17,392.24 කට සමාන වූ එජඩො මිලියන 115 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 6,835.91 කට සමාන වූ එජඩො මිලියන 45.2 ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරිමට බලාපෙරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කරන ලද අතර, 2021 සැප්තැම්බර් 30 දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2025 මාර්තු 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකු ප්‍රකාශයට අනුව, සත්‍ය වශයෙන් ලබා දී ඇති මුදල එජඩො මිලියන 8.1 කට සමාන රු.මිලියන 2,560.2 ක් වුවත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සපයන ලද තොරතුරු වලට අනුව ව්‍යාපෘතියට ප්‍රතිපූර්ණය කරන ලද මුදල එජඩො මිලියන 10.6 කට සමාන රු.මිලියන | ඒකාබද්ධ කිරීම අතරතුර, අත්තිකාරම් ගිණුම පරිපාලනමය අවශ්‍යතාව මත PMU 7 සිට PMU 4 වෙත මාරු කිරීමෙන් ප්‍රතිපූර්ණය කිරීමේදී අත්තිකාරම් ගිණුම අනුපිටපත් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එක් එක් ව්‍යාපෘති කළමණාකරණ ඒකකවල (PMU) ලෙජර් වාර්තා හෝ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය ශේෂයන් කෙරෙහි කිසිදු | වෙනස හඳුනා ගැනීම සඳහා සැසඳුමක් සකස්කර ඉන් පසු වැරදි ප්‍රකාශයන් නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 3,239.9 ක් වී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මගින් එම වෙනස සසඳා නොතිබුණි. | බලපෑමක් නැත. ලංකා විදුලිබල මණ්ඩලය සඳහා විගණන නිවැරදි කිරීම් වලට ඉඩ නොදෙන බැවින්, ඒකාබද්ධ ගිණුම් වලට ඇති බලපෑම මීළඟ මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කරනු ඇත. | |
| (ආ) | සටහන අංක 9 හි ගණනය කිරීම මත ලංකා විදුලිබල මණ්ඩල දායකත්වයේ අවසාන ශේෂය රු.මිලියන 3,262.4 ක් වන අතර එය මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට ගෙන තිබුණි.කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) දායකත්වය සඳහා වෙනම ලෙජර ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පොදු ලෙජරය සඳහා ප්‍රවේශය විගණකවරුන් වෙත ද ලබා දී ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ ශාඛා ගිණුම්කරණ පද්ධතිය යටතේ පොදු ලෙජරය පවත්වාගෙන යන බැවින් ලංකා විදුලිබල මණ්ඩල දායකත්වය සඳහා වෙනම ලෙජරයක් පවත්වාගෙන යන්නේ කෙසේද යන්න පැහැදිලි නැත.තවද, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමට පෙර සියලුම ජංගම ගිණුම් සසඳනු ලැබේ.අවශ්‍යවේ නම් සටහන අංක 09 හි ලංකා විදුලිබල මණ්ඩල දායකත්වයේ සංයුතිය පිළිබඳ සවිස්තරාත්මක ගණනය කිරීම් තවදුරටත් සැපයිය හැක. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වෙනම ලෙජර ගිණුමක් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | අග්‍රිම ගිණුමේ ශේෂය (එජඩො ශේෂය) ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය කිරීම මත ඇති වූ රු.මිලියන 16.4 ක ශුද්ධ විදේශ විනිමය ලාභය මූල්‍ය ප්‍රකාශනවල විදේශ මුදල් ලාභය ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | විනිමය ලාභ/අලාභ ප්‍රාග්ධනීකරණය කළ නොහැකි බැවින් 2023 වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩල ආදායම් ප්‍රකාශය වෙත ගැලපීම සඳහා සියලුම විනිමය ලාභ සහ අලාභ සාමාන්‍යාධිකාරී (AGM) ව්‍යාපෘති පිරිවැය මධ්‍යස්ථානය වෙත මාරු කරන ලදී. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතේ විදේශ විනිමය ලාභ ශේෂය ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 80 වන වගන්තිය | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 80 වන වගන්තියට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය නිතිපතා යාවත්කාලීන කෙරෙන ව්‍යාපෘති වෙබ් පිටුවක් පවත්වාගෙන යා යුතු අතර එහි (i) ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය, ලංසුකරු, කොන්ත්‍රාත් ප්‍රදානය (ii) ව්‍යාපෘතිය යටතේ බෙදා හරින ලද අරමුදල් භාවිතය සහ (iii) භෞතික ප්‍රගතිය ඇතුළත් වේ. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් සපුරා නොතිබුණි. | සටහන් කරගෙන ඇති අතර ඒ අනුව නිවැරදි කරනු ලැබේ. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| අංකය | සංරචකය / උප සංරචකය | 2023 දෙසැම්බර් 31 දිනට අපේකෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | 2023 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| (අ) | **පැකේජය 4**<br>කිලෝ මීටර් 285, කිලෝ වොට් 33 කුළුණු මාර්ග , 2 එස්එස්බීබී ගැන්ට්‍රි 13ක් ඉදිකිරීම. (285km ,33kV tower lines 13Nos of 33kV 2 SSBB gantries) | 100 | 64.7 (2024/03/31දිනට ප්‍රගතිය) | ව්‍යාපෘතිය 2019 මැයි 30 වන දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරන ලද අතර සම්පූර්ණ කොන්ත්‍රාත්තුවේ වටිනාකම එජඩො මිලියන 40.48 කි. මෙම කොන්ත්‍රාත්තුව බලාත්මක දිනය 2019 ඔක්තෝබර් 28 වන අතර කොන්ත්‍රාත් කාලය දින 730ක් විය.සම්පූර්ණ කිරීමේ දිනය 2021 ඔක්තෝබර් 27 වේ.මුල්ම වැඩ නිම කිරීමේ දින සිට වසර දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, 2024 මාර්තු 31 වන විට ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.වාර තුනක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර තුන්වන EOT අනුව අවසන් දිනය 2024 සැප්තැම්බර් 8 විය.2024 පළමු කාර්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 65 ක් වූ අතර කොවිඩ් වසංගතය සහ ගමනාගමන සීමා කිරීම්, ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ක්‍රියාකාරිත්වය යනාදිය ප්‍රමාදයට ප්‍රධාන හේතු වී තිබුණි. | හෙලිකල් නැංගුරම් දැමීමේ නව තාක්ෂණය හේතුවෙන්, හෙලිකල් අත්තිවාරම් සහිත කුළුණු මාර්ග ඉදිකිරීමේ දුෂ්කරතා , කුළුණු මාර්ග ඉදිකිරීම සඳහා තෙවන පාර්ශ්වයෙන් විරෝධතා සහ ගැන්ට්‍රි ඉඩම් නිරවුල් කිරීමේ ගැටළු හේතු විය. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) හරහා තෙවන පාර්ශ්ව විරෝධතා සහ ඉඩම් නිෂ්කාශන ගැටළු විසඳීම කඩිනම් කරන ලදී.ණය කල් ඉකුත්වන දිනට පෙර ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අවශ්‍ය සැලැස්මක් සකස් කර ඒ අනුව වැඩ කටයුතු සිදු කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී.ඒ අනුව සැලැස්මට අනුකූලව සිදුකරන බව සහතික කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුගේ වැඩ බිම් ක්‍රියාකාරකම් සමීපව නිරීක්ෂණය කිරීම සිදු කෙරේ.

**විගණකගේ නිර්දේශය**

වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.

(ආ) **පැකේජය 7**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ලොට් ඒ 1: පන්නිපිටිය කොටුමා උපපොළේ 100 MVAr BSC ස්ථාපනය කිරීම | 100 | 78.6 (2024/03/31 දිනට ප්‍රගතිය) | ව්‍යාපෘතියේ කටයුතු 2019 අගෝස්තු 1 වන දින ආරම්භ කරන ලද අතර එය 2021 ජනවාරි 21 වන දින අවසන් කිරීමට ආරම්භයේදී අපේක්ෂා කර තිබුණි.වාර 4ක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර හතරවන EOT අනුව අවසන් දිනය 2022 අප්‍රේල් 30 වී තිබුණි.කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පස්වන කාලය දීර්ඝ කිරීම(EOT) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර 2023 දෙසැම්බර් 31 වන විට ණය ලබා දී ඇත්තේ රු.මිලියන 97.1, එජඩො මිලියන 1.34 සහ යූරෝ මිලියන 3.4 කි. මූලික නිම කිරීමේ දින සිට වසර තුනකට වැඩි කාලයක් ගත වී ඇතත්, ව්‍යාපෘතිය 2024 මාර්තු 05 වන විට අවසන් කර නොමැති අතර 2023 ඔක්තෝබර් 19 වන දින සිට වැඩබිම් කටයුතු අත්හිටුවා ඇති අතර එය මාස තුනකට වැඩි කාලයක් වී තිබුණි.2024 පළමු කාර්තුව සඳහා වන ප්‍රගති වාර්තාවට අනුව, පරීක්ෂණ සහ ක්‍රියාත්මක කිරීමේ ගැටළුව තවමත් විසඳී නොමැති අතර ස්ථාපිත ධාරිත්‍රකවල (Capacitors) කාන්දුවීම් හඳුනාගෙන ඇති බව සඳහන් කර තිබුණි. | ප්‍රමාදයට හේතුව ඉදිරිපත් කර නොතිබුණි. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

කාලය දීර්ඝ කිරීම, පරීක්ෂා කිරීම සහ ආරම්භ කිරීම සඳහා වන වගකීම බෙදීම සහ සැපයූ ධාරිත්‍රකවල (Capacitors) කාන්දුවීම් හඳුනා ගැනීම පිළිබඳ ගිවිසුම්ගත ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. 2024 ජනවාරි කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා නැවත ආරම්භ කිරීමත් සමඟ 2024 මාර්තු 1 වන දින වැඩබිම් කටයුතු නැවත ආරම්භ කරන ලදී. හඳුනාගත් කාන්දුගත ධාරිත්‍රක සඳහා ප්‍රතිස්ථාපන ධාරිත්‍රක(Capacitors) සැපයීමට නිෂ්පාදකයා එකඟ වූ අතර 2024 ජුනි 27 දින වැඩබිමට නව ධාරිත්‍රක (Capacitors) ලැබුණි. කාලය දීර්ඝ කිරීම සහ වගකීම් බෙදීම පිළිබඳ ගැටළු නිරාකරණය කර 2024 දෙසැම්බර් 21 දක්වා කාලය දීර්ඝ කිරීම ලබා දී ඇති අතර පරීක්ෂා කර ආරම්භ කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

| | | | | |
|---|---|---|---|---|
| | **විගණකගේ නිර්දේශය** | | | වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ii) | ලොට් ඒ 3: 124Mvar බ්‍රේකර් ස්විච් කැපැසිටර් බැන්ක්ස් (Breaker Switched Switched Capacitor Banks) කොළඹ ස්ථාපනය කිරීම සහ තුල්හිරිය කොටුමා උපපොළේ ධාරිත්‍රක බැංකු ප්‍රතිස්ථාපනය කිරීම | 100 | - | කොන්ත්‍රාත්තුව 2022 මාර්තු 4 වැනි දින කොන්ත්‍රාත්තුකරුට ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත් ගිවිසුම 2022 මාර්තු 30 දින අත්සන් කරන ලද අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2022 ජුනි 10 දින ලබා දී තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූලි 19 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කරන ලද අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රතිපූරණය 2023 අගෝස්තු 08 සහ 2023 අගෝස්තු 23 යන දිනවල විය.<br>ඒ අනුව, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද අත්තිකාරම් මුදල ලබා ගැනීමට මාස දාහතරක් (මාස 14) ගත වී තිබුණි. |
| | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | | | මෙම කොන්ත්‍රාත්තුව අවසන් වූ දින සිට මාසයකින් 2023 අගෝස්තු වන විට අත්තිකාරම් අයකර ගන්නා ලදී. |
| | **විගණකගේ නිර්දේශය** | | | කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් කර ඇති කොන්දේසිවල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ණය ගිවිසුමට අනුව, ණය ක්‍රියාත්මක වන දිනය (අංක 3409 SRI ) 2017 ජූනි 29 වන අතර මූලික ණය අවසන් දිනය 2022 මාර්තු 31 වන අතර පසුව, වාර දෙකක් තුල වසර තුනකින් ණය දීර්ඝ කරන ලද අතර ණය අවසන් කිරීමේ දිනය 2025 මාර්තු 31 දින විය. අවසාන දීර්ඝ කිරීමේ ලිපියට අනුව, මෙම ණය මුදල සමුච්චිතව මාස 36කින් දීර්ඝ කර ඇති බවත්, ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් අවසන් දීර්ඝ කිරීම මෙය බවත් සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, පැකේජ 4 සහ 7 ලොට් ඒ 1 භෞතික ප්‍රගතිය පිළිවෙලින් 65 සහ 78 වූ අතර, 2024 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 69 සහ 74 වී තිබුණි. පැකේජය 4 භෞතික ප්‍රගතියෙන් සියයට 35 ක් සහ පැකේජය 7 ලොට් ඒ 1 භෞතික ප්‍රගතියෙන් සියයට 22 ක් ඉතිරි කොන්ත්‍රාත්තු දීර්ඝ කිරීමේ කාල සීමාව (මාස 12) තුළ සම්පූර්ණ කළ යුතු බව නිරීක්ෂණය වි තිබුණි. | ණය කල් ඉකුත්වීමේ දිනයට පෙර අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. | වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

### 3.3 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම්කරණය පිළිබඳ නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් තුළ, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු සාධාරණ කාල සීමාවක් තුළ (ආසන්න වශයෙන් මාස 02ක් ඇතුළත) ව්‍යාපෘති මූල්‍ය ප්රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2024 අප්‍රේල් 04 වැනි දින විගණනයට ඉදිරිපත් කර තිබුණි . | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන පදනම් වී ඇත්තේ ආයතනයේ ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශන මත වන අතර, ඒවා ඊළඟ මුදල් වර්ෂයේ පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර විගණක වෙත ඉදිරිපත් කළ යුතුය. එබැවින්, අප විසින් 2024 පෙබරවාරි 28 වැනි දින ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි ඉදිරිපත් කළ අතර නිසි අනුමැතිය ලත් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන 2024 අප්‍රේල් 04 වැනි දින වන විට විගණක වෙත ඉදිරිපත් කරන ලදී. නිසි පරිදි අනුමැතිය ලත් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර කාලය ඉතිරි කර ගෙන විගණනය සඳහා කෙටුම්පත් වාර්තා සහ අනෙකුත් ලිපිලේඛන එක්සෙල් ආකෘතිවලින් ලබා ගැනීමට හැකිය. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු සාධාරණ කාල සීමාවක් තුළ (ආසන්න වශයෙන් මාස 02ක් ඇතුළත) ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.4 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘතියේ මූලික අදියරේ දී ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කිරීමට නියමිතව තිබුණද, 2023 දෙසැම්බර් 31 වන දින වන විටත් ඉඩම් 8 ක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | කළමනාකාරිත්ව අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |